# සාරාංශය


අවුරුදු 3-5 අතර පසුවන ළමයින් ගේ සංවර්ධනය උදෙසා පෙර පාසල් දෛනික වැඩ සටහන තුළ ක්‍රීඩා හා ක්‍රියාකාරකම් යොදා ගන්නා ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ අධ්‍යයනයේ තේමාව විය.

පෙර පාසල් දෛනික සැලසුම තුළ ක්‍රීඩා හා ක්‍රියාකාරකම් යොදා ගැනීමේ දී මුල් ළමා විය සංවර්ධන අවශ්‍යතා ඉටුවන ආකාරයෙන් ක්‍රියාකරනවා ද යන්න විමසා බැලීම සඳහා මෙම අධ්‍යයනය යොමු වී ඇත.

අධ්‍යයනයේ දී ගොඩනගා ගත් අරමුණු මෙසේ දැක්විය හැකිය.

(1) අවුරුදු 3-5 අතර පසුවන පෙර පාසල් ළමයින්ගේ සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ වීම සඳහා ක්‍රීඩා හා ක්‍රියාකාරකම් දායක වන ආකාරය සාහිත්‍ය තුළින් විමර්ශනය කිරීම.

(2) පෙර පාසල් දෛනික ක්‍රියාවලිය තුළ ක්‍රීඩා හා ක්‍රියාකාරකම් යොදා ගන්නා ආකාරය විමසා බැලීම.

(3) ක්‍රීඩා ක්‍රියාකාරකම් පෙර පාසල තුළ යොදා ගැනීමේ දී මුල් ළමා විය සංවර්ධන අවශ්‍යතා පිළිබඳ ඉදිරිපත් වී ඇති න්‍යායාත්මක කරුණු හා කොතරම් දුරට සැසඳේ දැයි විමසා බැලීම.

(4) පෙර පාසල් දෛනික ක්‍රියාවලිය තුළ ළමා සංවර්ධනය උදෙසා ක්‍රීඩා හා ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කර ගත හැකි ආකාරය යෝජනා කිරීම.

කොළඹ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි පෙර පාසල් අතරින් පෙර පාසල් 06 ක් සහේතුකව තෝරා ගෙන එහි ගුරුවරියන් 6 දෙනෙකු ද අහඹු ලෙස තෝරා ගත් ළමයින් 04 දෙනකු ද යොදා ගෙන පෙර පාසල් දෛනික ක්‍රියාවලිය දින 01 බැගින් නිරීක්ෂණය කරන ලදී. ගුරුවරියන් 10 දෙනෙකු සඳහා ප්‍රශ්නාවලිය ඉදිරිපත් කරන ලදී. දත්ත එකතු කිරීම සඳහා අදාළ සාහිත්‍ය විමර්ශනය, ප්‍රශ්නාවලිය, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ යොදා ගැනිණ.

රැස්කර ගත් දත්ත වගු යොදා ගනිමින් තේමා යටතේ විශ්ලේෂණයට භාජනය කරන ලදී. වගු ගත කළ නොහැකි දත්ත විස්තරාත්මකව ඉදිරිපත් කරන ලදී.

ඔවුන් විසින් දරුවන් සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් ප්‍රමාණය අඩුවන බව හෙළිවිය. ආයතනයේ පරිපාලන ක්‍රියාකාරිත්වය ද ඒ සඳහා බලපා ඇති බව පැහැදිලි ය. අධ්‍යයනය මගින් අනාවරණය කර ගත් ආකාරයට පෙර පාසල් ගුරුවරියන් සියලුදෙනාම පාහේ කුමන හෝ අන්දමට පෙර පාසල් පුහුණුවක් ලබා ඇත. ගුරුවරියන්ගේ අධ්‍යාපන මට්ටම අඩුවනවිට දරුවන් ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වන ක්‍රීඩා හා ක්‍රියාකාරකම් සඳහා එතරම් අවස්ථා නොදෙන බව හෙළි විය. දෙමාපිය අපේක්ෂණය වී ඇත්තේ කියවීම ලිවීම කෙරෙහි බව අනාවරණය විය. නව අදහස් හා ක්‍රමෝපායයන් මගින් ඉගෙනුම් ක්‍රියාවලියේ නිර්මාණශීලිත්වය වැඩි දියුණුකර ගැනීම කෙරෙහි එතරම් උනන්දුවක් නොදක්වන බව අනාවරණය විය.

ගුරු සිසු අනුපාතය නිසි පරිදි යොදා ගැනීම සාර්ථක ඉගෙනුම් ක්‍රියාවලියක් සඳහා බලපාන බව පැහැදිලි විය.

කෙසේ වුව ද සෑම පෙර පාසලක්ම යම් ආකාරයක සැලසුමකට අනුව දෛනික සැලසුම ක්‍රියාත්මක කරන බව අනාවරණය විය. ගුරුවරියන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය අධීක්ෂණය කරමින් අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා නිරන්තර සේවාස්ථ වැඩමුලු පැවැත්වීමත් , දැනුම යාවත්කාලීන කළ යුතු බවත් යෝජනා කෙරේ.